**ජාතික ආරක්ෂක අරමුදල - 2014**

**---------------------------------------**

ජාතික ආරක්ෂක අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ආයෝජන ලේඛනය යනාදියෙන් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1985 අංක 09 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 12 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික ආරක්ෂක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 02 ප්‍රකාරව මෙහෙයුම් ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් වශයෙන් වර්ගීකරණය කර මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වාර්තා කළයුතු වුවද සමාලෝචිත වර්ෂය තුළ ඒ අනුව ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 07 අනුව දේපල පිරියත හා උපකරණවල සාධාරණ අගය පෙන්නුම් කිරීම සඳහා ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් වටිනාකම රු.11,030,000 ක් වූ ඉඩම්, රු.4,520,000 ක් වූ ගොඩනැගිලි හා පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු වටිනාකම රු.150,000 ක් වූ කෞතුක භාණ්ඩ ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

අරමුදලෙහි අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කළ යුතු වුවද අරමුදල සතු වත්කම් සම්බන්ධයෙන් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම්වලින් ජනනය වූ මූල්‍ය ප්‍රතිඵලය රු.66,075,563 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.80,688,937 ක් වුයෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.14,613,374 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ආයෝජන පොලී ආදායම රු.14,785,006 කින් හෙවත් සියයට 18 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තම රාජකාරි කටයුතු ඉටුකරන අතරතුර දී තුවාල ලද හෝ මියගිය පොලිස් බලකායේ හෝ සන්නද්ධ හමුදාවල හෝ යම් සාමාජිකයෙකුගේ පවුල් වලට යම් ප්‍රතිලාභ ගෙවීම ඇතුළුව ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම සහ සහතික කිරීමට වඩාත්ම හේතුවන්නේ යයි අරමුදලේ පාලක මණ්ඩලය අදහස් කරන ආකාරයට සහ කාර්යයන්ට අරමුදලට අයත් මුදල් ජනාධිපතිවරයාගේ විධිවිධාන වලට යටත්ව යොදාගැනීම අරමුදලේ පාලක මණ්ඩලයේ කාර්යය වී තිබුණි. වාර්ෂිකව උපයන ආදායම අදාල අරමුණ සඳහා උපයෝගී කරගැනීම ඉතා දුර්වල තත්ත්වයක පැවතුණි. පසුගිය වර්ෂ 05 ක් තුළ දරා තිබුණු සුභසාධක වියදම් හා රණවිරු පරිත්‍යාග පිළිබඳ විස්තර පහත දැක්වෙන පරිදිය.

| වර්ෂය | ලැබී ඇති මුළු ආදායම | සුභසාධක වියදම හා රණවිරු පරිත්‍යාග | ලද ආදායමෙන් සුභසාධක වියදම් හා රණවිරු පරිත්‍යාග සඳහා වැය කර ඇති ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| 2014 | 69,967,787 | 3,698,843 | 5.29 |
| 2013 | 84,776,544 | 3,892,332 | 4.59 |
| 2012 | 64,988,177 | 7,273,184 | 11.19 |
| 2011 | 49,082,045 | 32,250 | 0.06 |
| 2010 | 75,509,010 | 40,149,839 | 53.17 |

(ආ) විගණනයට ලැබී ඇති තොරතුරු අනුව යුද්ධයෙන් මියගිය හා අතුරුදහන් වූ ත්‍රිවිධ හමුදාවට අයත් සාමාජික සංඛ්‍යාව 25273 ක් හා ආබාධිත රණවිරුවන් සංඛ්‍යාව 18,256 ක් වූ අතර යුද්ධයෙන් මියගිය, ආබාධිත හා අතුරුදහන් වූ ත්‍රිවිධ හමුදාවේ හා පොලීසියේ රණවිරු පවුල්වල 5 වසරේ ශිෂ්‍යත්වය සමත් දරුවන් 138 දෙනෙකු වෙත සමාලෝචිත වර්ෂය තුළදී රු.3,450,000 ක ඉතුරුම් තැන්පත් ලබාදීම පමණක් සිදුකර තිබුණි. මේ අනුව ආබාධිත, මියගිය හා අතුරුදහන් වූ නිලධාරීන්ගේ පවුල්වලින් ඉතාමත් සීමිත ප්‍රමාණයකට පමණක් සහන සැලසීම සිදුවී තිබුණි. සමස්ථ සාමාජිකයන් වෙනුවෙන් විධිමත් සහනදායී වැඩ පිළිවෙලක් ඇති කර ඔවුන්ට සහන සැලසීම සඳහා වෙනත් විකල්ප ක්‍රියාමාර්ග කෙරෙහි අරමුදලේ අවධානය යොමුකර නොතිබුණි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

යුධ හමුදාවේ පරිහරණය සඳහා කුලියට ලබාදී තිබුණු අරමුදල සතු නිවාස 03 ක් වෙනුවෙන් 2012 දෙසැම්බර් මාසයේ සිට 2014 වර්ෂය අවසානය දක්වා එකතුව රු.1,387,500 ක් වූ නිවාස කුලී 2015 නොවැම්බර් 18 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම නිවාස සඳහා අයකරන කුලිය 2006 වර්ෂයෙන් පසුව සංශෝධනය කිරීමටද අරමුදලේ පාලක මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

### 5.1 අයවැය ලේඛනය

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 4.1(අ) වගන්තිය අනුව අරමුදල සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර නිසි අනුමැතිය සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. තවද එය ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් හා රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් අරමුදල විසින් එකී අවශ්‍යතාවයන් ඉටුකර නොතිබුණි.

(ආ) උක්ත චක්‍රලේඛයේ 4.1 (ඇ) වගන්තිය අනුව අනුමත කරන ලද අයවැය ලේඛනයකින් තොරව අදාල මුදල් වර්ෂයේදී කිසිදු වියදමක් නොදැරිය යුතු වුවත්, අරමුදල විසින් අනුමත කරන ලද අයවැය ලේඛනයකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.3,719,493 ක මුදලක් වියදම් කර තිබුණි.

### 5.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

---

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදයේ දැක්වෙන පරිදි පනතේ සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි.

### 5.3 පාලක මණ්ඩල රැස්වීම්

---

අදාල සාමාජිකයන් රැස්කර ගැනීමේ අපහසුතාවය නිසා රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බව අරමුදලේ ලේකම් විසින් විගණනයට දන්වා තිබුණි. මෙවැනි තත්ත්වයක් යටතේ අරමුදල මෙහෙයවීම සඳහා වැදගත් තීරණ ගැනීම කෙරෙහි එය බලපා ඇති බව නිරීක්ෂණය විය.

### 5.4 පද්ධති හා පාලන

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ ලේකම්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) ස්ථාවර වත්කම් කළමනාකරණය
(ඇ) කාර්යසාධනය